මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை.
The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: PFD/RED/01/01/2025/02
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2025.05. 30

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක: 02/2025

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
පළාත් පාලන ආයතන ප්‍රධානීන්

<u>අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි වාර්ෂික කාර්යසාධන වාර්තාව</u>

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 47 (4) වගන්තියේ විධිවිධාන යටතේ, එම පනතේ 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ (i) සහ (ii) අනුඡේදවලින් ආවරණය වන සෑම රාජ්‍ය අස්ථිත්වයක්ම, සෑම මුදල් වර්ෂයක්ම අවසන් වීමෙන් දින එකසිය අසූවකට නොඅඩු කාලයකදී අදාළ ලිඛිත නීතීන් සහ ඒ යටතේ සාදන ලද නියෝගවල නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතා සපුරාලීම සඳහා අනෙකුත් ලියවිලි අතර ගිණුම් සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන ඇතුළත් වාර්ෂික කාර්යසාධන වාර්තාවක්/වාර්ෂික වාර්තාවක් පළ කළ යුතු ය.

02. 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ ඇති රෙගුලාසි කෙටුම්පත් කිරීමේ අදියරේ පවතින අතර, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 67(6) වගන්තිය යටතේ එම නියෝග සකස් කරන තුරු මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් ජනාධිපති ලේකම්වරයා, භාණ්ඩාගාර ලේකම්වරයා සහ මහා භාණ්ඩාගාරය යටතේ වූ දෙපාර්තමේන්තු වල ප්‍රධානීන් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ, මෙම පනතේ විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට බලාත්මක වේ.

03. මෙම පසුබිම තුළ, 2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි I කොටසෙහි 15 හා 02/2020 හි 12 යන ඡේදයන්හි සඳහන් කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ දිනය වන **"මුදල් වර්ෂය අවසන් වී දින 150ක් ගත වීමට පෙර "** යන්න **"මුදල් වර්ෂය අවසන් වී දින 180ක් ගත වීමට පෙර"** ලෙස සංශෝධනය කරනු ලැබේ.

04. ඒ අනුව, කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 47(4) වගන්තියේ සහ රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හා 02/2020 හි දක්වා ඇති පරිදි, කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය පහත පරිදි වේ.

i) මුදල් වර්ෂයක් අවසන් වී දින 180 ක් ගත වීමට පෙර කාර්යසාධන වාර්තාව, පසුව පාර්ලිමේන්තුවේ සභා ගත කිරීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

ii) එසේම, කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට සමගාමීව, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 47(4) වගන්තියේ දක්වා ඇති පරිදි, අදාළ රාජ්‍ය අස්ථිත්වය විසින් කාර්යසාධන වාර්තාව රාජ්‍ය අස්ථිත්වයේ නිල වෙබ් අඩවියේ හෝ වෙනත් සුදුසු මාධ්‍යකින් පළ කිරීමට පියවර ගත යුතු ය.

කේ.එම්. මහින්ද සිරිවර්ධන
භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත්: 01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩල ලේකම්
04. විගණකාධිපති